ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்

LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.

"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.

චක්‍රලේඛ අංක - 07/2011

ඔබේ අංකය / உமது இல / YOUR NO

දිනය / திகதி / DATE 2011.12. ๒๐

සියලුම දිසාපති ඉඩම් කොමසාරිස්වරුන්,

ඉඩම් ආඥා පනත යටතේ නිකුත් කරන වාර්ෂික අවසර පත්‍ර (ඉ.කොං.75) සඳහා භාවිතා කරන ආකෘතිය අළුතින් මුද්‍රණය කර නිකුත් කිරීම.

විවිධතේ විවිධ ප්‍රදේශවල රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිකුත් කරන වාර්ෂික අවසර පත්‍ර ව්‍යාජ ලෙස නිකුත් කිරීම් පිළිබඳව නොරතුරු වාර්තා වී ඇත. මේ නිසා දිවයින තුළ රජයේ ඉඩම් සඳහා ව්‍යාජ වාර්ෂික අවසර පත්‍ර නිකුත් වීමේ ප්‍රවණතාවක් දැකී විය හැකි බැවින් 2012. 01. 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දැනට භාවිතයේ ඇති ඉ.කොං.75 දරණ ආකෘති පත්‍ර සංශෝධනයන් ඉවත් කර ඒ වෙනුවට ආරක්ෂිත විධිවිධානයක් ලෙස පසුබිමේ රාජ්‍ය ලාංඡනය සහිතව පවත්නා අංක ක්‍රමය සහිතින් මුද්‍රණය කරන ලද ආකෘති පත්‍ර නිකුත් කිරීමට තීරණය කර ඇත.

එසේ මුද්‍රණය කර ඇති මෙම ආකෘති පත්‍ර නිකුත් කිරීම විධිමත් වැඩපිළිවෙළක් යටතේ පමණක් සිදු කිරීමටද තීරණය කර ඇත. මේ අනුව ඉදිරියේදී ප්‍රාදේශීය ලේකම්වරුන්ට තම කොට්ඨාශය තුළ රජයේ ඉඩම් ආඥා පනත යටතේ වාර්ෂික අවසර පත්‍ර නිකුත් කිරීම අවශ්‍ය වන විට වාර්ෂික අවසරපත්‍ර නිකුත්කිරීමට විධිමත් අනුමැතිය ලබා දෙන අවස්ථාවේදී පමණක් ඉහත සඳහන් ආකෘතිපත්‍ර සංඛ්‍යාව නිකුත්කිරීමට කටයුතු කරන්න. ඔබගේ නිර්දේශය අනුව අවශ්‍ය වාර්ෂික අවසර පත්‍ර සංඛ්‍යාව මුද්‍රා හැරීමට මවිසින් කටයුතු කරනු ලැබේ. සෑම වාර්ෂික අවසර පත්‍රයක්ම අංක පිළිවෙළක් යටතේ විධිමත්ව මුද්‍රණය කර ඇති අතර එම අංක පිළිවෙළ මෙම කාර්යාලයේ සටහන් කර ගනු ලැබේ. කරුණාකර මේ අනුව නිකුත් කරන ඇණවුම් අදාළ නාම ලේඛණ සමඟ මා වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

මේ සමඟ ඔබගේ කාර්යාලයේ හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දැනට ගබඩා කර ඇති ඉ.කොං.75 ආකෘති පත්‍ර විනාශ කර දැමීමට උපදෙස් ලබා දෙන ලෙසද කාරුණිකව දන්වා සිටිමි. 2012.01.01 දින සිට ඉදිරියට නිකුත් කළ යුතු මෙම නව ආකෘති පත්‍රය යටතේ වන වාර්ෂික අවසර පත්‍ර පමණක් බව කාරුණිකව සලකන්න.

ආර්.සී.ආර්.රාජපක්ෂ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත් 1. ලේකම්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස

2. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත - අ.කා.ස

3. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් / සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) - අ.කා.ස

4. ඉඩම් කොමසාරිස් (ඉඩම්)/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (රත්ඛීම)/
සහකාර ඉඩම් කොමසාරිස් (නීති) - අ.කා.ස

දුරකථන 011-2797400 ෆැක්ස් / பெக்ஸ் 011-2864051 වෙබ් ලිපිනය / இணையம் www.landcommdept.gov.lk ඊමේල් / மின்னஞ்சல் landcom@landcommdept.gov.lk